# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පවතින පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා යථා පරිදි සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පාරිභෝගික කටයුතු සභාවේ ලේකම් තනතුර (HM 1-1)

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත විසින් නියමිත කර ඇති පරිදි, පාරිභෝගික කටයුතු සභාවේ එදිනෙදා කටයුතුවල සමස්ත පරිපාලනය කිරීමද සියලුම සභා වාර්තා සහ අනෙකුත් වාර්තා සටහන් පවත්වාගෙන යාම.

විමර්ශනය සඳහා යොමු කරනු ලැබ ඇති සියලුම කරුණු කාරණා සම්බන්ධ දැන්වීම් හා නිගමනයන් සකස් කර, බෙදහැරීම, සභාවේ විමර්ෂනයන් හා විභාග කිරීම් අරමුණු සඳහා, සභාවට අවශ්‍ය වන සියලු සාක්ෂි පිළියෙල කිරීම, සකස් කිරීම හා ලබාගැනීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා වෙනත් අදාළ ආයතන හා සමග සභාවේ විමර්ශන හා විමසීමේ අරමුණු සඳහා සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම.

**සුදුසුකම්**

**බාහිර** : නීතිඥවරයෙකු/ වරියක වීම සහ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස් උපාධියක්) සමග දිවුරුම් දීමෙන් පසු ලත් සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ සමාගම් ලේකම්වරයෙකු/ වරියක හෝ ව්‍යවස්ථාපිත සභාවක හෝ නියාමන ආයතනයක ලේකම්වරයෙකු / වරියක ලෙස වසර 15 (පහළොව) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද,

**අභ්‍යන්තර** : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ කාණ්ඩයේ (MM 1-1) I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවය.

**වැටුප් පරිමාණය** : HM1-1 2016

රු. (81,670 - 15X2,270-115,720) ක.සේ.දේ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි

**වයස** : වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.

**ප්‍රවාහන හා ඉන්ධන දීමනාව** : නිල රථයක් භාවිත කිරීමට හෝ මාසිකව රු. 50,000/= ක ප්‍රවාහන දීමනාව සහ ලීටර් 120 ක ඉන්ධන දීමනාව, ලැබීමට හිමිකාරීත්වය ලැබේ.

**පොදු කොන්දේසි**

**දීමනා** : ඉහත වැටුපට අතිරේකව ජීවන වියදම් දීමනාව, වෘත්තියවේදී දීමනාව සහ වෙනත් අදාළ දීමනාවන් අදාළ රජයේ චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය** : තනතුර ස්ථිර වන අතර, සේවක අර්ථසාධක අරමුදලට (EPF) හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) දායකත්වය හිමිවන අතර, අදාළ රජයේ චක්‍රලේඛවල ප්‍රතිපාදන / විධිවිධානවලටද හිමිකාරීත්වය ලැබෙනු ඇත.

**බඳවා ගැනීම් වැටුප**

බාහිරව බඳවා ගනු ලබන පුද්ගලයින් වැටුප් පරිමාණයේ මූලික පියවරෙහි/ තලයෙහි පිහිටුවනු ලබනු ඇත. අභ්‍යන්තරව බඳවා ගනු ලබන පුද්ගලයින්ගේ වැටුප, ආයතන සංග්‍රහය -Iහි VII වන පරිච්ඡේදයේ විධිවිධාන / ප්‍රතිපාදන පරිදි තීරණය කරනු ඇත.

**සේවය ස්ථිර කිරීම** : බඳවා ගනු ලබන අයවළුන් වසර තුනක (3) පරිවාස කාල සීමාවකට අපේක්ෂකයින් පත්කරනු ලැබේ. ඔහු / ඇය එම පරිවාස කාලසීමාව තුළ ඉටු කරනු ලබන සතුටුදායක කාර්ය සාධනය හා හැසිරීම මත තනතුරෙහි ස්ථිර කරනු ලබනු ඇත. දැනටමත් තනතුරක ස්ථිර සේවයේ සිටින අභ්‍යන්තරව තෝරාගනු ලබන අපේක්ෂකයින් එක් වසරක වැඩබලන කාලසීමාවකට යටත් කරනු ලබනු ඇත.

**බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය :**

බඳවා ගැනීමේ බලාධිකාරිය විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වෙනත් කරුණු :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටු කිරීමට හැකි වන අන්දමට කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- අනර්ඝ හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් අපේක්ෂකයින් විසින් මෙම දැන්වීමේ දින සිට **දින 14 ක්** ඇතුළත **2020.10.21** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ස්වකීය අයදුම්පත් ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් සමග අදාළ සහතික පත්‍රවල පිටපත් සුදුසුකම් සනාථ කිරීමේ ලේඛනගත සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. කවර ආකාරයෙන් අනිසි බලපෑම් කිරීමට උත්සාහ දැරීම නුසුදුසුකමක් වනු ඇත. අයදුම් කරනු ලබන තනතුර, ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය. ඔබගේ අයදුම්පත් කරුණාකර ඉදිරිපත් කළ යුතුය.

**සභාපති, සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය,**
**2 වන මහල, සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**